// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,446 - 2025 ජූලි මස 18 වැනි සිකුරාදා - 2025.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1210 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1213 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජූලි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ.බ.).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1207- B 82701 — 5,403 (2025/07)
F 1 -

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඨ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ *නැතහොත්* එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඞ්බෝඞ් පැඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

### පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත් ව සිටිය යුතු ය.

***සැ. යු.*** - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබාතිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2025 අගෝස්තු මස 18** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 ජුලි මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | නාත්තන්ඩිය | දකුණු පිටිගල් කෝරළය කොට්ඨාසයේ කොට්ටාරමුල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| පුත්තලම | මුන්දලම | පුත්තලම් පත්තු කොට්ඨාසයේ පෙරුක්කුවට්ටාන් ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |
| පුත්තලම | හලාවත | උතුරු පිටිගල් කෝරළය කොට්ඨාසයේ හලාවත නගර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |
| පුත්තලම | පුත්තලම | පුත්තලම කඩවත් සතර කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

07-622

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු

### මඩකලපුව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :-

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත් ව සිටිය යුතු ය.

***සැ. යු.*** - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2025 අගෝස්තු මස 20** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 ජූලි මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මඩකලපුව | එරාවූර් නගර | එරාවූර් කෝරළේ පත්තු කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව |
| මඩකලපුව | කාත්තාන්කුඩි | කාත්තාන්කුඩි දකුණ කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව |
| මඩකලපුව | කාත්තාන්කුඩි | මධ්‍යම කාත්තාන්කුඩි කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව |
| මඩකලපුව | මන්මුනයි උතුර | පුනොච්චිමුනයි කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව |
| මඩකලපුව | මන්මුනයි උතුර | කෝට්ටමුනයි කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව |
| මඩකලපුව | කෝරලයිපත්තු උතුර | රිදිතැන්න කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව |

07-730

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා සාමාජිකයකු පත්කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති නුසුදුසුකම්වලට යටත්ව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයක ඇති වී තිබෙන පුරප්පාඩුව පිරවීම සඳහා මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු වෙබ් අඩවියෙහි (www.parliament.lk) ක්ෂණික සබැඳි යටතේ ‘රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා සාමාජිකයකු පත්කිරීම’ නමින් පළකර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කළ යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025 අගෝස්තු 01** දින හෝ ඊට පෙර,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහලේකම්<br>
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය<br>
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව<br>
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ/විද්‍යුත් පණිවිඩයේ විෂයය වශයෙන් ‘රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා සාමාජිකයකු පත්කිරීම’ යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළකරන ලදී.

2025 ජූලි මස 17 වැනි දින.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහලේකම්,<br>
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,<br>
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,<br>
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

07-804

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2025 වර්ෂය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සිසු හෙද පුහුණු පාඨමාලාව සඳහා බඳවාගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2025.07.18 දින සිට 2025.08.12 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කල හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

1. සැළකිය යුතුයි :

| |
|---|
| 1.1. එක් අයදුම්කරුවකුට ඉදිරිපත්කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. එක් අයදුම්පතකට වඩා වැඩියෙන් ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන්ගේ සියලු අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2020, 2021, සහ 2022 යන සියලු වර්ෂ වලින් හෝ කිහිපයකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් අයකුට වුවද ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. එවැනි අයදුම්කරුවන්ට තම මනාපය අනුව තෝරාගනු ලබන එක් වර්ෂයකින් පමණක් අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි ය. වර්ෂ කිහිපයකින් අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතු ය. එසේ නොමැතිව වර්ෂ කිහිපයකින් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වේ නම් එකී සියලු අයදුම්පත් ද කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. |

1.2. පසුගිය වසර කිහිපයක් තුළ බඳවා ගැනීම් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එක් සිසුවෙකු විසින් රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද යටතේ විවිධ රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කිහිපයක ලියාපදිංචිවීම නිසා, සුදුසුකම් සහිත තවත් සිසුන් ගණනාවකට එවැනි එක් අවස්ථාවක් හෝ නොලැබීයාමේ තත්වයක් නිරීක්ෂණය විය. ඊට අමතරව මෙම තත්වය නිසා රජයේ මුදල් අපතේ යාමක් සිදුවන අතරම පාඨමාලාව අවසානයේ දී අපේක්ෂාකළ පුහුණු වෘත්තිකයින් සංඛ්‍යාව නොමැතිවීම නිසා අදාළ ආයතනවල සැළසුම්ගත ඉලක්කයන් ද ඉටුකරගත නොහැකිවේ. එබැවින්, මෙම තත්වය අවම කර සෑම අයදුම්කරුවෙකුටම එක් අවස්ථාවක් හෝ හිමිකරදීමට අවශ්‍ය ප්‍රතිපාදන මෙම *ගැසට්* නිවේදනයෙහි අංක 5 ඡේදය මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව අංක 5.1 සිට 5.5 දක්වා වන අනුඡේදවලින් සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි නුසුදුසු අයෙකු මේ සඳහා අයදුම් නොකල යුතුය. කෙසේ වෙතත්, එවැනි නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවක දී අනාවරණය වුවහොත් ඔවුන්ට විරුද්ධව *ගැසට්* නිවේදනයේ 9.3 අනුඡේදය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

1.3. පසුගිය බඳවාගැනීම්වල දී සාවද්‍ය තොරතුරු (සාවද්‍ය විභාග වර්ෂ, විෂයන්, ලබා ඇති ශ්‍රේණි යනාදිය) ඇතුලත් කර අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර, සමහර අයදුම්කරුවන් ව්‍යාජ තොරතුරු ඇතුලත් කර සකස් කරන ලද සහතික සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය විය. එය බරපතල වරදකි. එබැවින්, කිසිඳු අයදුම්කරුවෙකු තමා විසින් ඉදිරිපත් කරනු ලබන විද්‍යුත් අයදුම්පතට සාවද්‍ය තොරතුරු ඇතුලත් නොකළ යුතුය. සාවද්‍ය තොරතුරු ඇතුළත් කර ඉදිරිපත් කර ඇති සෑම අයදුම්පතක් ම කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කර, එවැනි අයදුම්කරුවන්ට විරුද්ධව නිත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරන අතර ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුළත් කිරීමට ද කටයුතු කරනු ලැබේ.

1.4. සෑම අයදුම්කරුවෙකු විසින්ම පළමුව මෙම *ගැසට්* නිවේදනයේ සහ වෙබ් අඩවියෙහි ඉදිරිපත් කර ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහාවන උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලූම කරුණු ඉතා හොඳින් කියවා තේරුම්ගෙන මෙම පාඨමාලාව සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට තමන් සුදුස්සෙකු බවට තහවුරු කර ගත යුතුය. අනතුරුව *ගැසට්* නිවේදනයේ 6.3 ඡේදයට අනුව ඕනෑම ලංකා බැංකු ශාඛාවකට රු.1000 ක මුදල ගෙවා ලබාගත් රිසිට් පත, 8.2.(ඇ), 8.2.(ඈ), හා 8.2.(ඉ) යන ඡේදවල දක්වා ඇති ලේඛණ ද සූදානම් කරගෙන අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කිරීමෙන් ඔබට අයදුම්පත් යොමුකිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුකළ හැකිය.

02. පාඨමාලාවට අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

| *අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාල වෙනත් සුදුසුකම් සහ විශේෂ කරුණු* |
|---|---|---|
| සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04 ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම. | 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2021 වර්ෂයේ හෝ 2022 වර්ෂයේ හෝ යන විභාගවලින් එකක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03 කින් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර);<br><br>*හෝ*<br><br>2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2021 වර්ෂයේ හෝ 2022 වර්ෂයේ හෝ යන විභාගවලින් එකක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03 කින් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර). | පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙහි කාලසීමාව අවුරුදු 03 කි.<br><br>පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුය.<br><br>2025.08.12 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 28 ට නොවැඩි විය යුතුය.<br><br>උස අඩි 04 යි අඟල් 10කට (147.3 CM) නොඅඩු විය යුතුය.<br><br>අවිවාහක විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය. |

අංක 01 වගුව

03. පාඨමාලාවට තෝරාගැනීමේ ක්‍රමවේදය :

3.1 සිසු හෙද පුහුණුව සඳහා බඳවාගැනීම අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවට හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් සිදුකරනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවාගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම් කරගනිමින් සිදුකරනු ලැබේ.)

3.2 දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත සම්පූර්ණ සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.3 ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2021 වර්ෂයේ හෝ 2022 වර්ෂයේ හෝ යන විභාග වලින් එකකදී එම එක් එක් විභාගයෙන් අයදුම්කර අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති සම්පූර්ණ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එම එක් එක් විභාගයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.4 ඉන්පසු එම එක් එක් විභාගයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාව හා භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ මෙම පාඨමාලාවට අයදුම්කර අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති සම්පූර්ණ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් විභාගයෙන් අදාළ එක් එක් විෂයධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.5 එලෙස එම එක් එක් විභාගයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් ද, 95% ක් ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විතවන ලෙස එම එක් එක් විභාගවලින් එක් එක් විෂය ධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

04. යෝග්‍යතාව -:

සෑම අයදුම්කරුවෙකු ම -

4.1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

4.2. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යහපත් කායික සහ මානසික සෞඛ්‍යයකින් ද යුක්ත විය යුතුය.

4.3. තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය පදිංචි දිස්ත්‍රික්කය ලෙස සලකා බැලීම සඳහා අයදුම්කරු එම දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන **2025.08.12** වැනි දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩ ව පදිංචි වී සිටිය යුතුය. එය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් එලෙස අඛණ්ඩ වසර 03 ක පදිංචි කාලසීමාව සනාථකළ නොහැකි අයදුම්කරුවන් සඳහා ඔවුන්ගේ පදිංචි දිස්ත්‍රික්කය ලෙස ඔවුන් විසින් අයදුම්කර ඇති දිස්ත්‍රික්කය ලබාදිය නොහැකි අතර, එවැනි අයදුම්කරුවන්ගේ පූර්ව පදිංචි කාලසීමාව පිළිබඳව සලකා බලා ඊළඟ අත්‍යාසන්න වැඩිම කාලසීමාවක් පදිංචිව සිටි දිස්ත්‍රික්කය අයදුම්කරුට හිමි දිස්ත්‍රික්කය ලෙස සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. මේ සඳහා අවශ්‍ය ලේඛණ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත අයදුම්කරු විසින් නොපමාව ඉදිරිපත් කළ යුතුය.

*සටහන* :-

යම් අයදුම්කරුවෙකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අයදුම්කරුවෙකුට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ පදිංචිය සනාථ කළ නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගනු ලැබේ.

05. පාඨමාලාව සඳහා අයදුම් කිරීමට හෝ ඇතුලත් වීමට හෝ නුසුදුස්සන් -:

5.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්වවිද්‍යාලයක / රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද" යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින /හදාරමින් සිටින අය.

5.2 ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින අය.

5.3 සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින අය.

5.4 ඉහත 5.1, 5.2 හා 5.3 යටතේ සඳහන් ආයතනයක පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් මෙම *ගැසට්* නිවේදනය පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කරගත්ත ද ඔවුන් මේ සඳහා අයදුම් කිරීමට / ඇතුලත් වීමට සුදුසුකම් නොලබති. තවද *ගැසට්* නිවේදනය පළවීමෙන් පසුව ද / සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ද ඉහත ආයතනයක අදාල පාඨමාලාවක ලියාපදිංචි වී එය අවලංගු කර ගත්ත ද ඔවුහු ද මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් නොලබති.

5.5 විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අය.

06. අයදුම් කළ යුතු ක්‍රමය :

6.1. මෙම පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ අදාල කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කර එවිය යුතුය.

6.2. අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

6.3. අයදුම්කරුවන් රු. 1000 ක මුදලක් ලංකා බැංකුව, තැප්‍රොබේන් <u>ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ විභාග ගාස්තු රැස්කිරීමේ ගිණුමට ගෙවිය යුතුය. සෑම අයදුම්කරුවෙකුම මෙම මුදල අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර</u> ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීමට කටයුතු කළ යුතු අතර, ඒ සඳහා ලැබෙන රිසිට් පතෙහි මුද්‍රිත අංකය අයදුම්පතේ අදාළ ස්ථානයට ඇතුලත් කිරීමෙන් පසුව පමණක් තම අයදුම්පත අන්තර්ජාලය ඔස්සේ ඉදිරිපත් කළ යුතුය. <u>මෙම ගෙවීම මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රයකින් හෝ අන්තර්ජාල බැංකු සේවාවක් මගින් සිදු නොකළ යුතුය.</u> මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ. ඔබ විසින් උක්ත ගෙවීමට අදාළ සාක්ෂි (රිසිට් පත) <u>සුරක්ෂිතව</u> තබාගත යුතු අතර, සම්මුඛ පරීක්ෂණයට සහභාගී වුවහොත් <u>එය අනිවාර්යයෙන් ම</u> ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු ගෙවීම් සිදුකර ඇති බවට නිරීක්ෂණයවන අයදුම්කරුවන් සහ රිසිට්පතක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන් මේ සඳහා බඳවාගැනීමට නුසුදුස්සන් සේ සලකා කටයුතු කරනු ලැබේ.

6.4. ඉදිරිපත් කරන ලද විද්‍යුත් අයදුම්පතෙහි පිටපත සහ අංක 05 කින් යුත් කේතය ලබාගැනීම.

(අ) මෙම *ගැසට්* නිවේදනයේ සහ ඒ සමගම විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වෙබ් අඩවියෙහි පළකර ඇති උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලු කරුණුවලට අනුව සාර්ථකව අයදුම්පතක් ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුට ම තම අයදුම්පත විධිමත් පරිදි යොමු වූ වහාම එහි පිටපතක් සහ තමාටම අනන්‍ය වූ අංක 05 කින් යුත් කේතයක් ලැබේ.

(ආ) සෑම අයදුම්කරුවෙකු විසින් ම එලෙස පරිගණක තිරයේ දිස්වන තම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (Print-out) ලබාගත යුතුය. එය තැපැල් මගින් එවීමට අවශ්‍ය නොවේ. අයදුම්පතක් ඉදිරිපත් කළ සෑම අයදුම්කරුවෙකුට ම තමා මේ සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ බව තහවුරු කිරීම සඳහා පවතින විධිමත් සහ එකම සාක්ෂිය මෙම පිටපත බැවින් එය සුරක්ෂිතව තබා ගැනීම ඔබ සතු වගකීමකි. ඊට අමතරව අංක 05 කින් යුත් කේතය ද සුරක්ෂිතව තබාගැනීමෙන් ඔබ විසින් ඉදිරිපත් කළ අයදුම්පතේ පිටපත් පසුව ලබාගත හැකිය.

(ඇ). යම් අවස්ථාවක තම අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු එහි පිටපතක් හෝ අංක 05 කින් යුත් කේතයක් නොලැබෙන අයදුම්කරුවන් වේ නම්, ඔවුන්ගේ අයදුම්පත් නිසි පරිදි උඩුගත වී /ඉදිරිපත් වී නොමැති

බව වටහා ගත යුතුය. එවැනි සියලු දෙනාම අයදුම්පත් ඉදිරිපත් නොකළ සිසුන් ලෙස සලකනු ලැබේ. ඒ අනුව එවැනි අයදුම්කරුවෙකු කඩිනමින් පහත 6.5. (අ) ඡේදයේ දක්වා ඇති දුරකථනය හෝ / සහ විද්‍යුත් තැපැල හරහා **මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකය** සමග සම්බන්ධ වී තම අයදුම්පත පිළිබඳ ගැටලුව 2025.08.12 දිනට පෙර විසඳා ගෙන තමාට අයත් කේතය හා අයදුම්පතෙහි පිටපත ලබාගැනීමට කටයුතු කළ යුතු අතර, මෙම කාර්යය සම්පූර්ණයෙන් ම අයදුම්කරු සතු වගකීමක් බව ද අවධාරණය කරමි. කෙසේ වෙතත්, විධිමත් පරිදි මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැති විද්‍යුත් අයදුම්පත් සම්බන්ධයෙන් **2025.08.12 දිනෙන්** පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ද කිසිසේත් සලකා බලනු නොලැබේ.

(ඈ). තවද, අයදුම්කරුවෙකු විසින් මෙම බඳවාගැනීමට අදාළ කිසියම් කරුණක් සම්බන්ධයෙන් කරනු ලබන සෑම ඉල්ලීමක් සමගම තම අයදුම්පතෙහි පිටපතක් එවිය යුතු අතර, එය නොමැතිව ඉදිරිපත් කරනු ලබන කිසිදු ඉල්ලීමක් පිළිබඳව සලකා බලනු නොලබන බව ද වැඩිදුරටත් අවධාරණය කරමි.

6.5. අත්‍යාවශ්‍ය තොරතුරු දැනගැනීම සඳහා විමසීම් :

(අ). මෙම පාඨමාලාව සඳහා අයදුම්කිරීමට සියළු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී කිසියම් ගැටලුවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා හෝ ඉහත 6.4. (ඇ). ඡේදයේ දැක්වෙන ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහා පමණක් **සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00** දක්වා කාලය තුළ **සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකථන අංක 0112 340 007** අමතන්න. hrcodmoh@gmail.com **විද්‍යුත් තැපැල් ලිපිනයෙන්ද සම්බන්ධ විය හැකිය. (විද්‍යුත් තැපැල ඔස්සේ සම්බන්ධ වන සෑමවිටම එහි ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකථන අංකයක් සඳහන් කිරීම අනිවාර්ය වේ.)**

(ආ). අදාළ සියළු තොරතුරු මෙම *ගැසට්* නිවේදනයෙහි සහ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙ හි සවිස්තරව දක්වා ඇති බැවින්, වෙනත් කරුණු පිළිබඳව විමසීමෙන් වළකින්න.

07. අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :

7.1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු / ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු /ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු / රජයේ විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 512148/- කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළයුතුය.

7.2 මෙම *ගැසට්* නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබව කැඳවනු ලැබුවහොත් ඉදිරිපත් කළ යුතු තොරතුරු :

8.1. ඔබ විසින් සාර්ථකව උඩුගතකර ඇති විද්‍යුත් අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් මෙම තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ සහ මෙම *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් පහත 8.2.(අ) සිට 8.2.(ඒ) දක්වා වූ අනුඡේදවල දැක්වෙන ලිපිලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

8.2. නොවැලැක්විය හැකි හේතුවක් මත (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පිළිගතහැකි) කිසියම් අයදුම්කරුවෙකුට යම් සහතිකයක් / ලේඛනයක් එදිනට ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ උපදෙස් පරිදි එකී සහතික / ලේඛන සම්මුඛ පරීක්ෂණ දිනයේ සිට දින 07ක් ඇතුළත මෙම අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II වෙත පැමිණ භාරදිය යුතු අතර, එසේ නොකරන සියලු අයදුම්කරුවන් මේ සඳහා තෝරාගැනීමට නුසුදුස්සන් සේ සලකා කටයුතු කරනු ලැබේ. :

(අ) විද්‍යුත් මාධ්‍යයෙන් උඩුගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත.
(7.1 ඡේදයේ දක්වා ඇති නිලධාරියෙකු ලවා සහතික කරන ලද),

(ආ). උප්පැන්න සහතිකය,

(ඇ). අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද),

(ඈ). අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ),

(ඉ). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු දේශීය රියැදුරු බලපත්‍රය,

(ඊ). රු. 1000 ක මුදල ගෙවූ බවට සනාථ කෙරෙන රිසිට්පතෙහි මුල් පිටපත,

(උ). පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය. (ඩී එස් - 04),

(ඌ). ශිෂ්‍ය කාර්ය දර්ශනය (පාසල් හැරයාමේ සහතිකය - අධ්‍යාපන බී 59 පොදු ආකෘති පත්‍රය),

(එ). ඉහත අංක 5.5 අනු ඡේදයෙහි දක්වා ඇති පරිදි විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අයෙකු නොවන බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ රු. 50 ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය,

(ඒ). ඉහත අංක 5 ඡේදයෙහි 5.1 සිට 5.4 දක්වා වූ අනු ඡේදවලින් විස්තර කර ඇති පරිදි නුසුදුසුකම් නොපවතින අයෙකු බව සනාථ කිරීම සඳහා වන බහුමාන සහතිකය.

8.3. *සටහන* :-

ඉහත 8.2. ඡේදය යටතේ දක්වා ඇති ආ, ඇ, ඈ, ඉ සහ ඌ යන අනු ඡේදවල සඳහන් ලේඛනවල තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේ දී රැගෙන ආ යුතුය.

**09. වෙනත් කරුණු-**

9.1 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) මෙම පාඨමාලාවට අයදුම්පත් කැඳවීමේ දිනට එනම් 2025.07.18 දිනට පෙර දිනයක් විය යුතුය.

9.2 ඉහත කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන් ම ඔබව මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට්* නිවේදනයේ කුමන හෝ වගන්තියක් මගින් අදහස් නොකෙරෙන බව තරයේ සිහි තබා ගත යුතුය. එමෙන්ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් හෝ ඔබ කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව දැනගත යුතුය.

9.3 ඉහත 5.1, 5.2 හා 5.3 යටතේ සඳහන් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින අයෙකු හෝ 5.4 හා 5.5 ඡේදවල දක්වා ඇති නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවකදී අනාවරණය වුවහොත් අදාළ පාඨමාලාවෙන් / තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් ඔවුන් වෙනුවෙන් රජය විසින් දරා ඇති සියලුම වියදම් අයකර ගැනීමට ද ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුලළත් කිරීමට ද කටයුතු කරනු ලැබේ.

9.4 සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම අධ්‍යාපන හා අනෙකුත් සහතිකවල වලංගු දිනය අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වන 2025.08.12 දින හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.

9.5 මෙම පාඨමාලාව සඳහා *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් නොමැතිව අයදුම් කිරීමෙන් පසු, එමගින් අයදුම්කරුට සිදුවන අපහසුතා පිළිබඳව මෙම අමාත්‍යාංශය විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

9.6. පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබේ.

9.7 සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු කිසිදු වගන්තියකින් අදහස් නොකෙරේ.

9.8 සම්මුඛ පරීක්ෂණයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු HTTP://WWW.HEALTH.GOV.LK මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ. කෙසේ වෙතත්, අවස්ථානුකූලව පැනනගින විශේෂිත තොරතුරු පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය වුවහොත් ඒවා ඔබ විසින් අයදුම්පත සමග ඉදිරිපත් කර ඇති දුරකථන අංක සහ/හෝ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ සිදුකරනු ලැබේ. එබැවින්, අයදුම්පත සමග ඉදිරිපත් කරන ලද දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය නොවෙනස්ව, සක්‍රීයව තබාගැනීම ඔබගේ වගකීමක්වන අතර, ඒවායේ වෙනස්වීම් මත හෝ අක්‍රියව පැවතීම මත අදාළ තොරතුරු නිසි කලට සන්නිවේදනය නොවීම නිසා සිදුවිය හැකි ගැටලු සහගත තත්වයන් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

9.9 *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් නියමිත පරිදි පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගි නොවූවන් විසින් හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගි වී නියමිත දිනට ලියාපදිංචි නොවූ අයදුම්කරුවන් විසින් හෝ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව පාඨමාලාවට ඇතුළත් වීම සඳහා ඉදිරිපත් කරනු ලබන අභියාචනා කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ.

10. පුහුණු කිරීමේ පරිපාටිය :

10.1. සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරාගනු ලබන අයදුම්කරුවන් මෙම පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදෑරිය යුතු මාධ්‍යය අංක I වගුවේ දක්වා ඇත.

10.2. පුහුණු පාසල්වලට ඇතුළත් කරන සිසුන් ඒවායෙහි බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

10.3. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත්වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායකවන හෝ විභාග, නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවාගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට අනාවරණයවන හෝ සිසුන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකිය.

10.4. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී සිසුන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි VI විධිවිධානවලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

10.5. පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පාඨමාලාව අත්හැර නොයන බවටත්, පුහුණුව සම්පූර්ණයෙන් ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාලපරිච්ඡේදයක් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවය යටතේ සේවය කරන බවටත්, <u>සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නිලධාරියකු සමග ගිවිසුමකට එළඹිය යුතු අතර, ඔබගේ පුහුණුව හා අනිවාර්ය සේවා කාලය සම්බන්ධයෙන් වූ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරනු ලබන ඇපකරයට පිළිගත් ඇපකරුවන් දෙදෙනෙකු සහිතව එළඹිය යුතුය</u>. ඉහත 10.3 කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත්වන, පුහුණුව හැරයන, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවන හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදය ඉහත පරිදි අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වන සිසුන් පුහුණුවෙන් / තනතුරෙන් ඉවත්කරන අතර අදාළ කාලය තුළ දී ඔවුන් වෙත රජය විසින් ගෙවන ලද දීමනා, දරන ලද විය හියදම් හා ගිවිසුම්ගත මුදල සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව හා නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10.6 මෙම පාඨමාලාව සඳහා අයදුම්කරන අයදුම්කරුවන් අයදුම්පත් කැඳවීමේ ආරම්භක දිනය වනවිට අවිවාහක/ දික්කසාද නොවූ අයකු වියයුතු අතර, පුහුණුව ලබන කාල සීමාව තුළදී ද අවිවාහකව සිටීම <u>අනිවාර්යය</u> වේ.

11. සේවයේ නියුක්ත කරවීමේ නියමයන්:

11.1. පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත්, පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණකරන සිසුන්ගේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැලකිල්ලට ගෙන අදාල තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ. එලෙස තෝරා ගනු ලබන සිසුන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා බැඳී සිටිය යුතුය.

11.2. එකී පත්වීම්ලාභීන් වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

11.3. අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් නිවැරදිව ඇතුලත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසුව හෝ ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔවුන්ගේ නම් ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද, පුහුණු කාලය තුළ දී රජය විසින් ගෙවන ලද දීමනා, දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල අය කර ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

11.4. තෝරාගත් අයදුම්කරුවන් පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

11.5. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසි වලට, රජයේ චක්‍ර ලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

11.6. පාඨමාලාවට බඳවාගනු ලබන සිසුන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා අදාළ තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් ගාස්තු අය කරනු ලැබේ.

11.7 පුහුණු කාලසීමාව තුළ දී සිසුන්ට වෘත්තීය සමිති කටයුතුවල නිරතවීමට හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිදු අයිතිවාසිකමක් නොමැත.

11.8. පාඨමාලාවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණයවන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2025 ජූලි මස 04 වැනි දින,
" සුවසිරිපාය ",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ - 10.

07-690

**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
වෘත්තීය අධ්‍යාපන අංශය

**ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණකාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත් කරගැනීම - 2025 වර්ෂය**

2025 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. (අ) වයස : 2025.08.18 වැනි දිනට අවුරුදු 16ත් 22ත් අතර විය යුතුය.

(ආ) **අධ්‍යාපන සුදුසුකම් :**

අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත් වීම;

*හෝ*

ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත් වීම.

**විශේෂ කුසලතා :**

විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරගවලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ඉහත ක්ෂේත්‍රයන්ගෙන් ජාතික මට්ටමේ තරගවලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහළ ජයග්‍රහණයක් ලබා ඇති අයදුම්කරුවන් ඉහත **(ආ)** සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්ය.

**(ඇ)** **සැ.යු.** ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග වසර 03ක් හෝ වැඩි කාලයකට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකළ යුතුය.

02. පාඨමාලා මාධ්‍යය :

**මෙහි දැක්වෙන සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර , මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පවත්වනු ලැබේ.**

**සෛද්ධාන්තික දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන්ද පැවැත්වේ.**

03. ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණය :

අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

(අ) විභාගය **පවත්වන මාධ්‍යය** : සිංහල / දෙමළ

(ආ) **විභාග මධ්‍යස්ථාන** : කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය සහ වවුනියාව (ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථානවලින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් වෙනත් මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත.)

විභාගයට අදාළ විෂයයන් :

ඇතුළත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විතවන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කාර්මික දැනුම, කාර්මික ඇඳීම සහ ඉංග්‍රීසි භාෂා දැනුම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

04. විභාග ගාස්තු :

අයදුම්පතෙහි සඳහන් ක්‍රමවේදයට අනුව විභාග ගාස්තු වශයෙන් රු.1,000/- ක මුදලක් ගෙවිය යුතුය. මෙම **ක්‍රමවේදය හරහා හැර වෙනත් කිසිඳු ක්‍රමයකට ගෙවන ලද විභාග ගාස්තු පිළිගනු නොලැබේ.**

ඇතුළත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

05. මූලික තෝරාගැනීම :

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතා පදනම මත යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත.(අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ)

06. අවසන් තෝරා ගැනීම :

යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදුකරනු ඇත. ලකුණු ලබාදෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40% ක් ද සම්මුඛ පරීක්ෂණය සඳහා 60% ක් ද වශයෙනි. විෂයය බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත්ව පුහුණු පාඨමාලා සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතුය.

07. පුහුණු පාඨමාලා :

| *අනු. අංකය* | *පාඨමාලාව* | *කාලසීමාව (අවුරුදු)* |
|---|---|---|
| 01 | මෝටර්රථ තාක්ෂණ ශිල්පී<br>Automobile Technician | 04 |
| 02 | මිල්රයිට් තාක්ෂණ ශිල්පී<br>Millwright Technician | 04 |
| 03 | වායු සමීකරණ සහ ශීතකරණ තාක්ෂණ ශිල්පී<br>Refrigeration & Air Conditioning Technician | 03 1/2 |
| 04 | බල විදුලි තාක්ෂණ ශිල්පී (කර්මාන්තගත)<br>Power Electrical Technician (Industrial) | 03 1/2 |
| 05 | යන්ත්‍රණ ශිල්පී<br>Machinist (General) | 03 1/2 |
| 06 | කර්මාන්තගත මෙකාට්‍රොනික් තාක්ෂණ ශිල්පී<br>Industrial Mechatronics Technician | 03 1/2 |
| 07 | ඩීසල් කාර්මික ශිල්පී<br>Diesel Mechanic | 03 |
| 08 | වාහන විදුලි ශිල්පී<br>Automobile Electrician | 03 |
| 09 | පෑස්සුම් ශිල්පී<br>Welder | 03 |
| 10 | මෝටර් වාහන බොඩි අලුත්වැඩියා හා පින්තාරු ශිල්පී<br>Motor Vehicle Body Repairer & Painter | 03 |

අයදුම්කරුගේ කැමැත්තේ අනුපිළිවෙල අනුව උක්ත පාඨමාලා සඳහා අයදුම් කළ යුතුය.

08. **ගිවිසුම් අත්සන් කිරීම :**
ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාළව අවු. 03, 03 1/2, 04 ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

09. අයදුම් කිරීම සඳහා උපදෙස් :
**සියලුම අයදුම්කරුවන් අයදුම් කිරීම සිදුකළ යුත්තේ** මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ පමණක් වේ.

මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සිදුකළ යුතුවන අතර අදාළ මාර්ගගත ක්‍රමය (Online System) සඳහා පිවිසීමට පහත සඳහන් සබැඳිය භාවිතා කළ යුතු වේ. :

**fta.germantec.lk**

තාක්ෂණික විමසීම් : 0701 640 650 (පෙ.ව. 08.00 සිට ප.ව.05.00 දක්වා)

මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් කිරීමට පෙර අදාළ සබැඳියෙහි දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් අයදුම් කිරීම සිදුකළ යුතුය.

සෑම අයදුම්කරුවෙකුට ම මාර්ගගත ක්‍රමය (Online System) හරහා අයදුම්කළ පසු එම අයදුම්පතෙහි පිටපතක් මුද්‍රණය කර ලබා ගැනීමේ හැකියාව සලසා දී ඇති අතර එසේ ලබා ගන්නා දෘඩ පිටපත (Hard Copy – PDF) සමඟ පහත සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා පහතින් දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමු කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අ.පො.ස. සාමාන්‍ය පෙළ සහතිකය
(ඇ) ඉහත අංක 01හි විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන්
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් නිකුත් කර ඇති පළාත්/ජාතික මට්ටමේ සහතිකය

අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2025" යනුවෙන් සඳහන් කළ යුතුය.

ඉහත ලබා දී ඇති උපදෙස් පිළිබඳව අවධානයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් අයදුම්කරු පත්වන අපහසුතාවය පිළිබඳව ආයතනය කිසිදු වගකීමක් දරනු නොලබන අතර අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු කූට හෝ වංචනික බවට හෙළිවුවහොත් අයදුම්කරු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන අතර මින් ඉදිරියට ආයතනයේ විභාග සඳහා ද නුසුදුස්සෙකු වනු ඇත.

වැඩිදුර විස්තර සඳහා www.germantec.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **:**
**අංක 09 හි ඇති සබැඳියෙහි (link) දක්වා ඇති උපදෙස් පත්‍රිකාව අනුගමනය කරමින්** 2025.08.18 **දින හෝ එදිනට පෙර මාර්ගගත ක්‍රමය** (Online System) ඔස්සේ අයදුම් කිරීම සම්පූර්ණ කළ යුතුය.

11. **විභාග ප්‍රවේශපත්‍ර :**
සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාළ විභාග ප්‍රවේශපත්‍ර **2025.09.04** දින වනවිට ලැබීමට සලස්වන අතර **ඒ වන විටත්** ප්‍රවේශපත්‍ර නොලැබුණු අයදුම්කරුවන් වේ නම් එදින සිට දින 03ක් ඇතුළත පහත දුරකථන අංකයෙන් විමසිය යුතුය.

කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය**
**අංක 582, ගාලු පාර, ගල්කිස්ස.**
(අඟුලාන හංදිය අසල)
දුරකථන අංක : 0112605625 / 0112605535

07-732

දැනුම් දීමයි

**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත සිසුන් බඳවා ගැනීම - (SLIATE)**
**2025 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) 2025 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළව 2025 ජූනි මස 13 වැනි දින ප්‍රකාශයට පත්කළ *ගැසට්* නිවේදනය හා බැඳේ.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙ හි උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම් කිරීමේ අවසන් දිනය 2025 ජූලි මස 28 දින දක්වා දීර්ඝ කර ඇත. වැඩි විස්තර නිල වෙබ් අඩවිය www.sliate.ac.lk හෝ apply.sliate.ac.lk වෙත පිවිසෙන්න.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.

07-726

---

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා
විද්‍යාවේදී (හෙද) උපාධිධාරීන් බඳවා ගැනීම-2025

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මගින් විද්‍යාවේදී හෙද උපාධිය ලබා ඇති පහත සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අයදුම්කරුවන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන, පවතින පුරප්පාඩු අනුව වාර්ෂිකව පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් 25% ක් විද්‍යාවේදී හෙද උපාධිය මත අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් තෝරා ගනු ලැබේ. ඒ අනුව හෙද අනුස්ථාපන හා පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් 875 දෙනෙකු තෝරා ගැනීමට නියමිතය.

2. තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාව විසින් පිළිගත් ආයතනයකින් විද්‍යාවේදී (හෙද)උපාධිය {B.Sc.(Nursing) Degree} සම්පූර්ණ කර තිබිය යුතුය.

3. කායික සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :

(අ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

(ආ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ඇ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) ස්ත්‍රී /පුරුෂ දෙපක්ෂයට ම අයදුම් කළ හැක .

(ඉ) 2025.08.08 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ඊ) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය 2025.06.30 දිනට පෙර දිනයක් විය යුතුය.

(ඌ) සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය වනවිට ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතු ය.

4. අයදුම් කළයුතු ආකාරය :

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතුය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතුය. අයදුම්පතේ අනු අංක 01 සිට 14 දක්වා පළමු පිටුවේ ද අනු අංක 15 සිට 17 දක්වා දෙවන පිටුවේ ද අනු අංක 18 තෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතුය.

(ආ) උපාධි සහතිකයේ හා GPA අගය දැක්වෙන විස්තරාත්මක ප්‍රතිඵල සහතිකයේ තමා විසින් සත්‍ය බවට සහතික කරනු ලැබූ පිටපතක් බැගින් අයදුම්පතට ඇමිණිය යුතුය.

(ඇ) අයදුම්කරුවන් රු.1,000.00 ක මුදලක් ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක 7041318 දරන විභාග ගාස්තු රැස්කිරීමේ ගිණුමට බැරකර අදාළ ලදුපත අයදුම්පතෙහි කොටුව තුළ ඇලවිය යුතුය. එම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(ඇ) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත, ආයතන ප්‍රධානියා මගින් අත්සන සහතික කර ඉදිරිපත් කළ යුතුය. අනෙකුත් අයදුම්කරුවන් අයදුම්පතෙහි තම අත්සන, තම කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා / රජයේ පාසලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු / බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු / රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා සහතික කර ඉදිරිපත් කළ යුතුය.

(ඉ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරින් බඳවා ගැනීම- 2025" වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර අධ්‍යක්ෂ (පාලන)-01,සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 ලිපිනයට 2025.08.08 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

5. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින් සිය අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බවත් අදාළ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් සිහි තබාගත යුතුය.

6. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා 2025.08.08 දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලද බව ද දන්වා එවනු නොලැබේ.

7. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතුරින් ඔවුන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හෙද ව්‍යවස්ථාවේ හා මෙම නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

**සටහන-**

(අ) සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවා ගතයුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ඇත.

(ආ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි සඳහන් වගන්ති කිසිවකින් අදහස් නොවන අතර එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ නුසුදුසු වූ හා තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු www.health.gov.lk යන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පමණක් පළකරනු ලබන අතර, කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

8. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය.:-

(අ) උප්පැන්න සහතිකය.

(ආ) උපාධි සහතිකයේ මුල් පිටපත සමඟ GPA අගය දැක්වෙන විස්තරාත්මක ප්‍රතිඵල සහතිකය හා තමා විසින් එම ලේඛන සත්‍ය බවට සහතික කරනු ලැබූ පිටපත.

(ඇ) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හා තමා විසින් සත්‍ය බවට සහතික කරනු ලැබූ එහි පිටපත.

(ඈ) ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචි වූ බවට අදාළ ලිපිලේඛන.

9. පුහුණු කිරීමේ පටිපාටිය :

| පාඨමාලාව | පාඨමාලා කාලසීමාව | භාෂා මාධ්‍යය |
|---|---|---|
| හෙද අනුස්ථාපන හා සමායෝජන | මාස 06 | ඉංග්‍රීසි |

(අ) තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අදාළ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට අනුයුක්ත කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි භාෂාවෙන් හැදෑරිය යුතුය.

(ආ) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කළට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය අවසානයේ දී සාර්ථකව එය නිම නොකරන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැක.

(ඈ) පුහුණුව ලබන කාල පරිච්ඡේද තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි දැක්වෙන විධිවිධානවලට යටත්ව සිසු හෙද /හෙදියන්ට තෙවන වසරේ දී ලබාදෙන මාසික දීමනාව ලබා දෙනු ඇත.

(ඉ) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිමකරන බවටත්, පුහුණු පාඨමාලාව අතහැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන් ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලද හොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාලපරිච්ඡේදයක් අදාළ පළාත්සභාවට හෝ රේඛීය අමාත්‍යාංශයට අයත් පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදාළ තනතුරේ සේවය කරන බවටත්,සෞඛ්‍ය ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකු සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු අතර, එම ගිවිසුම හා ඇපකරය පුහුණුවට ලියාපදිංචිය ලබන දිනයේම අධ්‍යාපන,පුහුණු හා පර්යේෂණ ශාඛාව වෙත බාරදිය යුතුය. පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැර ගියහොත් හෝ ඉහත (ඇ) වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම ලැබ වර්ෂ පහක (05) කාල පරිච්ඡේදයක් අදාළ පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත් එම මුදල් ආපසු අය කර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් -

පුහුණුව අවසානයේ අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදුකරන/නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒඅනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු අනුව 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MT-7-2025 වැටුප්කේතයට අදාළවැටුප් පරිමාණයේ (රු.54,920- 10×800-11×1,190-10×1,320-10×1,350-රු.102,710)

උපලේඛන III හි සඳහන් පරිදි 04 වන පියවරේ තබා වැටුප් ගෙවීම මත III ශ්‍රේණියේ හෙද නිලධාරි තනතුරට පත්කිරීමට කටයුතු කෙරේ.

11. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන අතර, ඒ දෙනු ලබන පත්වීම අවලංගුකර තනතුරින් පහ කිරීම හෝ පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. තවද ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර, නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ ඇයගේ නම ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික, මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

13. මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීමට හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කළ බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු සිදු කරනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ සේවකයින්ට අදාළවන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට, මුදල් රෙගුලාසිවලට, හෙද සේවා ව්‍යවස්ථාවට හා එයට වරින්වර සිදු කරනු ලබන සංශෝධනවලට හා කලින් කළට බලපවත්නා රජයේ පොදු රෙගුලාසිවලට යටත්වනු ඇත.

15. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබා දෙන්නේ නම් ඒ සඳහා තක්සේරු නිවාස හා කාමර කුලිය, ජලය හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම නිවේදනය මගින් ආවරණයවන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්ත්වයක් උදාවුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

2025 ජූලි 18 දින සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී.

| අයදුම්පත් අංකය | |
|---|---|

**ආදර්ශ අයදුම්පත්‍රය**

හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා

විද්‍යාවේදී (හෙද) උපාධිධාරින් බඳවා ගැනීම - 2025

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය හොඳින් කියවා බලන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | | | | | | |
| 02. | සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | | | | | | |
| 03. | සම්පූර්ණ නම සිංහලෙන් /දෙමළෙන් | | | | | | |
| 04. | ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | |
| 05. | ජංගම දුරකථන අංකය (WhatsApp සහිත) | | | | | | |
| 06. | තැපැල් ලිපිනය | | | | | | |
| 07. | ස්ථිර ලිපිනය | | | | | | |
| 08. | පදිංචි දිස්ත්‍රික්කය | | 09. | ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි කරුවෙක් ද? | | | |
| 10. | උපන් දිනය | වර්ෂය | | මාසය | | දිනය | |
| 11. | 2025.08.08 දිනට වයස | අවු: | | මාස: | | දින: | |
| 12. | ස්ත්‍රී/පුරුෂභාවය ☑සලකුණ යොදන්න) | ස්ත්‍රී | | පුරුෂ | | | |
| 13. | ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග ☑ සලකුණ යොදන්න | ඔව් | | නැත | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14. | අධ්‍යාපන සුදුසුකම් - | | | | |
| | සමත් වූ උපාධිය | උපාධිය වලංගු වන දිනය | ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) | විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය |
| | | | | | |
| | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15 | ඔබ කවදා හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? (☑ සලකුණ යොදන්න) | ඔව් | | නැත | |
| | පිළිතුර ඔව් නම් ඒ පිළිබඳ විස්තර | | | | |

16. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් අයදුම්පත් කැඳවීමේ නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත් ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවත් මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පුහුණුවට නුසුදුස්සෙකුවන බව හා පත්වීම් ලද හොත් ඉන් අනතුරුව එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත්වන බව ද මම දැනසිටිමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, මට අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, හොඳින් අවබෝධ කරගෙන සිටින බවත් ප්‍රකාශ කර සිටිමි.

රු. 1,000.00 ගෙවා ලබා ගත් බැංකු ලදුපත මෙහි අලවන්න

…………………..
දිනය

……………………………………
අයදුම්කරුගේ අත්සන

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................................................ මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද ඔහු / ඇය .................................. දින ................................. දී මා ඉදිරිපිට ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

දිනය : ............................

.................................................................

සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව

අත්සන සහතික කරන්නාගේ නම : .....................................................

තනතුර : .....................................................

ලිපිනය : .....................................................

18. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න)

ඉහත අයදුම්කරු / අයදුම්කාරිය වන ................................................................................................ මහතා / මහත්මිය / මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ............................................ තනතුර දරන බව මින් සහතික කරමි.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, පුහුණුව සඳහා තෝරාගත හොත් ඔහු / ඇය නිදහස් කළ හැකි / නොහැකි බව දන්වමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත් ඔහු/ඇය අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

දිනය : ............................

....................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම : .....................................................

තනතුර : .....................................................

ලිපිනය : .....................................................

07-766

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.